# (71) සිංහල

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතර ව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **අටකින්** සමන්විත වේ. **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු** ප්‍රශ්නය : මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ - ඉ) | අවබෝධය | ලකුණු 16 |
| (ඊ) | අවස්ථා සම්බන්ධය | ලකුණු 12 |
| (උ) | රසාස්වාදය | ලකුණු 12 |
| | | ලකුණු 40 |

ප්‍රශ්න අංක **2** සිට **8** තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකස් කරනු ලබන අතර ඉන් **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 60 = 100

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතර ව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස (**පළමු** ප්‍රශ්නය) : මෙම ප්‍රශ්නය වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **20කින්** සමන්විත වේ. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 20 කි.

II කොටස : මෙම කොටස ප්‍රශ්න **හතකින්** සමන්විත වේ. **දෙවන** හා **තෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.

| | | |
|---|---|---|
| **2** ප්‍රශ්නය : | අවබෝධය | ලකුණු 12 |
| | සාරාංශය | ලකුණු 13 |
| **3** ප්‍රශ්නය : | රචනය | ලකුණු 25 |
| **4** ප්‍රශ්නය : | සදොස් තැන් නිදොස් කිරීම<br>කර්මකාරක වාක්‍ය<br>නිවැරදි වචන තේරීම | ලකුණු 15 |
| **5** ප්‍රශ්නය : | ව්‍යාකරණමය අනුඅංගය තේරීම | ලකුණු 15 |
| **6** ප්‍රශ්නය : | උපසර්ග, සන්ධි, ප්‍රකෘති, විකෘති කථනය<br>විභක්ති, ක්‍රියා, තද්ධිත, යෝග්‍ය පද භාවිතය<br>පිළිබඳ අවබෝධය | ලකුණු 15 |
| **7** ප්‍රශ්නය : | භාෂා අවබෝධය | ලකුණු 15 |
| **8** ප්‍රශ්නය : | ව්‍යාකරණ ප්‍රවර්ග පිළිබඳ අවබෝධය | ලකුණු 15 |

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 25 + 25 + 30 = 100

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

# (71) සිංහල

I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

- පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**1.** (අ) "ඌ තමන් උගත් වාද දහස ම විචාළෝ ය. මහතෙරුන්වහන්සේ විසඳාලූසේක. විසඳා නිමවාලා 'තොප විචාරණ ප්‍රශ්න මෙතෙක් ද? තවත් ඇත් ම දැ'යි විචාළසේක. උගත් වාද එතෙක් ම හෙයිනුත් එම පිරිමසා ඇවිදි පමණක් මුත් ඔබ්බෙන් උගත් දෙයක් නැති හෙයිනුත් පුරාතනයන් සිතා උපදවාලූවා තමන් සිතාගෙන කියාලන්ට බල නැති හෙයිනුත් 'එතෙකැ'යි කිවුය.' තොපි අප අතින් බොහෝ ප්‍රශ්න විචාළා වේ ද? අපිත් ඒ විසඳා කීමෝ වේ ද? තොප අතින් අපි බොහෝ කොට නොවිචාරම්හ. එක සුඟක් විචාරම්හ ඒ කියවු දැ'යි විචාළසේක. 'විචාළමැනව, ස්වාමීනි'යි කිවුය. 'වදාළ එකක් විචාරම්හ'යි කී හෙයින් එම අල්වාගෙන 'එකෙක් නම් කිම් දැ'යි විචාළසේක. ඌ තමන් පිටත් ශාස්ත්‍ර උගත් බව මුත් ශාසනසමය නොදන්නා, විචාළ ලෙසට විසඳන ලෙස නොදැන 'ඒ කිම් දැයි ස්වාමීනි'යි විචාළෝය. 'හෙම්බා පරිව්‍රාජිකාවෙනි, තෙලෙ බුදුන්ගේ පැනයෙකැ'යි කීසේක. තමන් ශාස්ත්‍රලෝභී හෙයින් 'මාත් ස්වාමීනි ඒ උගන්වා වදාළ මැනවැ'යි කිවුය. 'බුදුහු පවා දායාද ඉල්වූ රහල් කුමරුන්ට "අප සේවගෙන හැරගනුව"යි වදාළසේක. තෙපිත් අප සේ වූ නම් දෙම්හ'යි වදාළසේක. 'එසේ වී නම් මා මහණ කළමැනව'යි කිවුය. මහතෙරුන්වහන්සේත් මෙහෙණින්නන්ට කියාලා මහණ කැරවූසේක. උයිත් මහණ ව මාලුපැවිදි ව කුණ්ඩලකේසී නම් ස්ථවිරී ව කීප දවසකින් **පිළිසිඹියා පත්** රහත් ව එවක මරණදුකින් ගැලවුණා සේ ම සසරදුකිනුත් ගැළවුණාහුය."

(i) පරිව්‍රාජිකාව මහතෙරුන්වහන්සේගෙන් විමසූ ප්‍රශ්න ප්‍රමාණය දහසකට පමණක් සීමා වූයේ කුමක් නිසා ද?

(ii) පරිව්‍රාජිකාව තමා මහණ කරන ලෙස මහතෙරුන්ගෙන් ඉල්ලා සිටියේ ඇයි?

(iii) "රහල් කුමරුන්ට 'අප සේවගෙන හැරගනුව'යි වදාළසේක." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'පිළිසිඹියා පත්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ආ) "එකල **කර්මාන්විත වූ** ව්‍යාධියක් හැර අවශේෂ වූ ව්‍යාධි එක ආලේපමාත්‍රයෙකින් අන්තර්ධාන වන තරම් දිව්‍යමය වූ ඖෂධ උගන්වන්නා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍යශාස්ත්‍රය උගන්වා නිමවූහ. ශක්‍රයන්ගේ ආනුභාවයෙන් උගන්නා ශිල්පය කල් පමා කොටලා ගියේ න යත්, එසේ නැති. අනුන් සොළොස් අවුරුද්දකින් උගන්වන්නා වූ ශිල්පය ශක්‍රයෝ තමන්ගේ ආනුභාවයෙන් ජීවකයන් සත් අවුරුද්දෙකින් ඉගැන්වූහ. එකල ජීවකයෝ වෛද්‍යය තමන්ට නිමි සේ දැන ආචාරීන් කරා ගොස් 'ස්වාමීනි, නුඹගේ මේ ශිල්පයෙහි නිමාමෙක් කවර කලෙක වේ දැ'යි විචාළහ. ආචාරි 'මොහුගේ ශක්ති පරීක්ෂා කෙරෙමි'යි සිතා 'එසේ වී නම් පුත, තෙපි මේ නුවර සතරවාසලින් පිටත්ව ලා සතරදවසක් සතරයොදනක් තැන් වෙන වෙන ම ඇවිද ඖෂධයකට නොගත හැකි මුලක් මලක් පොත්තක් අත්තක් එලයක් පතක් සොයා ගෙන අවුත් මට පෑ බලගැ'යි කීහ."

(i) මෙම ඡේදයෙහි ඇතුළත් ව්‍යාධි ප්‍රභේද කවරේ ද?

(ii) ජීවක මැනවින් ශිල්ප ලබා ගත්තේ දැ'යි ඇදුරුතුමා පරීක්ෂා කළේ කෙසේ ද?

(iii) "ශක්‍රයන්ගේ ආනුභාවයෙන් උගන්නා ශිල්පය කල් පමා කොටලා ගියේ න යත්" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'කර්මාන්විත වූ' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඇ) “මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමග එක් ව කෙළ ඇවිද ලියමඬුලු වන ලැහැප් අතල ගල් ගං හිස් ගිරිමුදුන් රුක් යට වැලිතලාදී වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තීගේ අදෝනා කම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි” යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තේ ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේය. රජ ද විදි තැන ම සිටියේය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනා තොම මහ බෝසත්හු මෙලෙස හඬතත් තමාගේ කෙළියෙහි ඇලී මත් වන ලද්දී බෝසත්හු විත් කැ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහ බෝසත්හු විසංඥ ව වැදහොත් නියාව දැක “ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන් දැ”යි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වෑහෙන්නා වූ ලේ දැක ප්‍රිය වූ ස්වාමි පුත්‍රයා කෙරෙහි සෝකය දරා ගත නොහී ආක්‍රෝශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ. සැඟ වී සිටි රජ කිඳුරා මළේ වනැ යි හෙලින් බැස “තී හඬන්ට කාරණා කවරේ දැ යි මම තී **පාදපරිචාරිකා** කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි” යි යන ආකාර දැන්වීය.”

(i) කිඳුරා විත් කැ නියාව කිඳුරිය දැන ගත්තේ කෙසේ ද?

(ii) කිඳුරා, මළේ යැයි සැක කළ රජු කිඳුරියට ඉදිරිපත් කළ අදහස කුමක් ද?

(iii) “මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි” මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘පාදපරිචාරිකා’ යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඈ) “එකල්හි ඔහු පිටුපස හුන්නා වූ ස්වර්ණතිලකා තොම නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්ත ව මදලස බැල්මකින් රජහු මුහුණ බලා ‘තමා පෙරව හුන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා දක්වාලුව’. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලෝක හා රූපසම්පත්තිය දැක කාමයෙන් විසංඥ ව සිහි මුළාව මඳ ඇසිල්ලකින් ලබන ලද ආශ්වාද ඇතිව “මෝ තොම සස්වාමික ද අස්වාමික දැ”යි විචාරා “අස්වාමික ය, එතෙකුදු වුවත් සැඩොල් දුවක” යනු අසා අනුන් බණන නින්දා බසට හයින් ස්වර්ණතිලකාව **අන්තඃපුරයට** ගත නොහී “මේ බඳු වූ වර්ණ සෞන්දර්යයක් හා රූපසම්පත්තියකින් යුක්ත වූ ස්ත්‍රී රත්නයක් නොලබන්නා වූ මට ජීවිතයෙන් ප්‍රයෝජන කිම්දැ”යි ශෝකාතුර ව නොයෙක් ප්‍රලාප කියා හඬමින් කාමයෙන් මත් ව කටයුතු නොකටයුතු සලකා ගත නොහී කඩුව ගෙන තමන් හිස තුමූ ම කපා මළහ.”

(i) ස්වර්ණතිලකා දැකීමෙන් රජු තුළ ඇති වූ වෙනස කතුවරයා ඉදිරිපත් කරන්නේ කෙසේ ද?

(ii) ස්වර්ණතිලකා රජුගේ අන්තඃපුරයට ඇතුළත් කර ගත නොහැකි වූයේ ඇයි?

(iii) ‘තමා පෙරව හුන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා දක්වාලුව’. මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘අන්තඃපුරය’ යන වචනයට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඉ) සොඳ පුන්සඳ සොමි කිරණින් පිහිකු ළු
වැ ද සුරගඟ රළ වට කළ සුලකු ළු
න ද සිරිසර පාමින් රන්ගිරි කු ළු
ඇ ඳ පිරිසිදු සුදු සිනිඳු කසී ස ළු

හිම කර සුරසිඳු කොඳ මුතු හ රෙ හී
පැහැසර යුරු සුදඟර ගෙන වෙ රෙ හී
මල කර පල පලු වැනි **සුරතු** **රෙ හී**
මන හර සිවුසැට බරණින් සැ රෙ හී

(i) රන් ගිරි කුළෙහි ශෝභාව කවර ආකාරයෙන් නිරූපිත ද?

(ii) රජු ඇඟ ගැල් වූ අංගරාවල ස්වභාවය කෙබඳු ද?

(iii) “මල කර පල පලු වැනි සුරතු රෙ හී
මන හර සිවුසැට බරණින් සැ රෙ හී” මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘සුරතුර’ යන වචනයට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියමී"

(ii) "පුතණුවෙනි, කුමක් කියන්නෙහි ද? මාගේ ඇස් දෙකත් මාගේ හදවතත් නුඹත් මේ සතර ම මට සම ම ය."

(iii) "මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව."

(iv) "ඊට කිසි සැකයක් නො සිතා ඉතා ප්‍රපඤ්ච නො කොට උදාසන්හි ම නික්මුණ මැනව."

(v) "බලපුළුවන්කාරයොත් එක්ක පොරට යන මිනිහා මෝඩයා. වෙදරාල කියන බෙහෙත, බෙහෙතමයි"

(vi) "මිරිඟුවක් ද මේ සියල්ල-අතුරුදහන් වන සැණෙකින්"

(vii) "දුව බය නොවී ඉන්න. මට එහෙම දුක් විඳින්න වෙන්නෙ නැහැ."

(ලකුණු 03 x 4 = 12 යි.)

(උ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මා පමණි ඔබ කැටුව ආවේ
මම ද යමි දියණියනි
මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්.

මෙතෙක් ලොව නො ඇසුව
මියුරු නැළවිලි ගී
ළයට කැටි කොට නිදයි ඔබෙ මව
අවදි වන ඇසිපියෙන්
බිඳී සුන් වන ලොවක.
බිහි නොවූ හෙට දවස
ඇය නොදත් රහස දැන
කාලයේ ගැබ තුළෙහි
ඉකි බිඳියි කම්පාව.

දස එකඩ මසක් ඈ රැකි
සෙනෙහසේ නිධානය
වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
නුහුරු බස් තෙපළමින්
වට වෙමින් අඬු නියෙන්
පැහැර සඟවන අතර,
බලා සිටියෙමි කොනක
ගොළු වෙමින් අසරණ ව.

සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩැලි පෙරළන්න
මවගෙ ඇකයෙහි පහස
නො දත් දැරියකි සිඟිති.

කිරි ගරුඬ කොත් හෙළන
අඳුරු සෙවණැලි අතර
නුහුරු නුපුරුදු ලොවක
සැතපෙන්න දියණියනි.

මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්. (ලකුණු 12 යි.)

**2.** "සද්ධර්මරත්නාවලී කතා කලාවෙහි විශේෂත්වය වන්නේ වර්ණනාත්මක ශෛලියට නැඹුරු වූ බස් වහරක් යොදා ගැනීම යි." නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

**නැතහොත්**

පාඨක සිත් ග්‍රහණය කර ගන්නා ආකාරයට අවස්ථා හා සිද්ධි නිරූපණයෙහි ලා කතුවරයා දැක්වූ කුසලතාව නිර්දිෂ්ට ජාතක කථා ඇසුරෙන් අගයන්න.

(ලකුණු 15 යි.)

**3.** මනුෂ්‍ය සන්තානයේ සංකීර්ණ ස්වභාවය පිළිබිඹු කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇද්දැයි නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

**නැතහොත්**

ජීවමාන ආකාරයෙන් චරිත හැසිරවීමෙහි ලා පූජාවලිය කතුවරයා දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කථා වස්තු ඇසුරෙන් පිරික්සන්න.

(ලකුණු 15 යි.)

**4.** (අ) සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් කෝට්ටේ යුගය කවරාකාර වැදගත්කමක් දරන්නේදැයි පහදන්න. (ලකුණු 07 යි.)

(ආ) ගුත්තිලය රසවත් කාව්‍යයක් බවට පත්ව ඇති ආකාරය උදේනි පුර සැණකෙළි වර්ණනය ඇසුරෙන් නිදර්ශන දක්වමින් විමසන්න. (ලකුණු 08 යි.)

**5.** "සොබාදහම මෙන් ම සමාජ බලවේග ද මිනිසාගේ පැවැත්ම කෙරෙහි බලපෑම් කරන ආකාරය කලාත්මක ව චිත්‍රණය කර ඇති කෘතියක් වශයෙන් බැද්දේගම නවකතාව අගය කළ හැකි ය." සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**6.** විවිධ සමාජ ස්තරවලට අයත් පුද්ගල චරිත ස්වභාවය සියුම් ලෙස විග්‍රහ කිරීමට කෙටිකතාකරුවන් දක්වන සාමර්ථ්‍යය නියමිත කෙටි කතා **තුනක්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**7.** "අද්‍යතන කවීන් සමකාලීන සමාජ ස්වරූපය විචිත්‍රත්වයෙන් යුතු ව ඉදිරිපත් කළ ආකාරය සනිදර්ශන ව සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**8.** "පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ විශේෂත්වය වනුයේ චරිත හා අවස්ථා නිරූපණය සඳහා කාව්‍යමය භාෂා ව්‍යවහාරයක් යොදා ගැනීමයි." නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

* * *

# (71) සිංහල

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

- * **I** කොටසේ **1** ප්‍රශ්නය ද **II** කොටසේ **2**, **3** ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- * **I** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- * **I** කොටස, **II** කොටසේ පිළිතුරුපත් සමග අමුණා භාර දෙන්න.

---

### I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 දන්තජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ත ථ ද ධ න ප ස (2) ත ථ ද ධ න ල ස (3) ත ද න ශ ස ල ච
(4) ථ ධ න ප ල ක ග (5) ක ච ත ද ල ස ව (................)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) පුස්ථකාලය, උත්කෘෂ්ඨ, වීරෝධාර, විශිෂ්ඨ, සමස්ත
(2) පුස්තකාලය, උත්කෘෂ්ට, වීරෝධාර, විශිෂ්ට, සමස්ථ
(3) පුස්ථකාලය, උත්කෘෂ්ඨ, වීරෝදාර, විශිෂ්ට, සමස්ථ
(4) පුස්තකාලය, උත්කෘෂ්ට, වීරෝධාර, විශිෂ්ඨ, සමස්ත
(5) පුස්තකාලය, උත්කෘෂ්ට, වීරෝදාර, විශිෂ්ට, සමස්ත (................)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කතරගම, තංගල්ල, නාරම්මල, ගාල්ල
(2) අනුරාධපුර, අත්තනගල්ල, අම්බලන්ගොඩ, අවිස්සාවේල්ල
(3) කළුතර, තණමල්විල, නිකවැරටිය, මහනුවර
(4) වලපනේ, සඳලංකාව, යාපනය, හික්කඩුව
(5) කෑගල්ල, නාත්තණ්ඩිය, මහරගම, ත්‍රිකුණාමලය (................)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) 'ඖ' ස්වරය නියෝජනය කරන පිළි සංකේතය වනුයේ 'ගයනුකිත්ත' යි.
(2) 'ඖ' ස්වරය සිංහලයේ ඕනෑ ම අකුරක් හා සම්බන්ධ කොට යෙදිය හැකි ය.
(3) 'ඖ' යන සන්ධ්‍යක්ෂරය සැකසෙනුයේ 'අ + ඌ' දෙකේ එකතුවෙනි.
(4) 'ගයනුකිත්ත' පදයක ආරම්භයේ භාවිත වෙයි.
(5) සිංහල වචනවල, රකාරාංශයෙන් පර ව ද 'ගයනුකිත්ත' යෙදේ. (................)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ක්‍රීඩා ප්‍රවෘත්ති, තිරසාර සංවර්ධනය, අමාත්‍ය මණ්ඩලය, ආගන්තුක සත්කාර
(2) භූ විද්‍යා, තර්ක ශාස්ත්‍රය, චන්ද්‍ර මඬල, ජීව භාෂාව
(3) සමාජ ප්‍රශ්න, නිවාස ව්‍යාපෘතිය, දෛනික කටයුතු, පාද යාත්‍රාව
(4) ලොව්තුරු දම්, දෙව් මැඳුර, දම්සෝ නිරිඳු, කාන්තා නියෝජනය
(5) රුක් රෝපණය, බලශක්ති අමාත්‍යාංශය, නීති විශාරද, අන්ධ භක්තිය (................)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) සන්ධි, ලිංග, විභක්ති, සමස් (2) පරාක්‍රමබාහු, විජයබාහු, අග්‍රබෝධි, කාශ්‍යප
(3) බලය, ඵලය, කුලය, කළය (4) සකුණ, දකුණ, ප්‍රගුණ, සුගුණ
(5) නිවාස, සහවාස, ආවාස, පවස (................)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සඳ, මඟ, කිඳුරු, සයුරු (2) ඉසි, මන්, මෙත්, මුදිතා

(3) විදුරු, සිත්, පාත්‍ර, මතුරු (4) දළ, සතුට, වස්ත්‍ර, හිස

(5) වස්, දාස, වෙහෙර, පොත (................)

1.8 කරණ, සබඳ, අවදි හා අදර යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සොරබිය, වනමල්, මවුගුණ, අත්කම් (2) අත්කම්, වනමල්, සොරබිය, මවුගුණ

(3) මවුගුණ, වනමල්, අත්කම්, සොරබිය (4) අත්කම්, මවුගුණ, සොරබිය, වනමල්

(5) වනමල්, සොරබිය, මවුගුණ, අත්කම් (................)

1.9 කෘදන්තයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) හාරන, තෝරන, පීරන, සූරන (2) කැ, දැ, සැ, පැ

(3) ගැස්සීම්, බැස්සීම්, පැස්සීම්, ඉස්සීම් (4) මුද්‍රිත, භාෂිත, පතිත, ලිඛිත

(5) ගෙරවිලි, ඔංචිලි, බැලිලි, වැනසිලි (................)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "එව කව **බොව** කියන"

(ආ) "තමා දුක් ගනිති සත **රකිමින්**"

(ඇ) "**අඬා ලා** කම්පාව උන්නත්"

(ඈ) "**කියත** උන් මෙතෙපල"

(1) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා

(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා

(3) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(5) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා (................)

1.11 තද්ධිතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සිරිමත්, දිරිමත්, රුමත්, ඉසුරුමත් (2) පුතණු, දියණි, සොයුරාණ, මයිලණු

(3) මධුරතම, වෘද්ධතර, ස්වර්ණමය, චිරන්තන (4) නුවනත්, මුහුළස්, සිසිලස්, සවනත්

(5) කැඳිති, සිගිති, මලිති, ඇබිති (................)

1.12 උපසර්ගයක් යෙදී **නොමැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) පිළිතුරු, පිළිල, පිළිබඳ, පිළිමල් (2) සුපතළ, සුමට, සුපසන්, සුමිහිරි

(3) අධිපති, අනුමාන, අවමාන, අපහාස (4) සම්මාන, සන්දර්ශන, සංයුක්ත, සංවේදනා

(5) ඉපැරණි, ඉමහත්, අබිමන්, නිදොස් (................)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) උදෙසා, අරබයා, පිණිස, නිසා (2) මෙන්, සෙන්, කෙරෙන්, විසින්

(3) අහෝ, අනේ, අපොයි, අය්යෝ (4) තෙක්, දක්වා, කරා, තුරු

(5) පමණ, වාගේ, තරම්, විතර (................)

1.14 **"පුවත්පත්** කතුවරු **ආගමික** සහජීවනය මෙන් ම **භාෂානුරාගය** ද වර්ධනය කිරීමට කටයුතු කළහ." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, තද්ධිත, සන්ධි
(2) තද්ධිත, සමාස, සන්ධි
(3) තද්ධිත, සන්ධි, සමාස
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) සන්ධි, සමාස, තද්ධිත (................)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) වැටුණෝ ය, බැලුවේ ය, ඇඬී ය, කැඩුණේ ය.
(2) මිදුණා ය, ඇඹරුණා ය, සැදුණී ය, කැපිණි.
(3) දමා, අසා ලා, ගොස්, කරමින්
(4) සැකසුණෝ ය, පැසසුණේ ය, ලියැවුණාහ, කැඩුණෝ ය.
(5) ඇන-ඇන, පිස-පිස, දැක-දැක, වැඳ-වැඳ (................)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සුදුරෙදි, වනවදුල, නවදොර, නිලුපුල්
(2) පින්කැටය, මල්යහන, මහල්නිවස, රත්මල්
(3) අතිරේක, ප්‍රගතිවාර්තා, භක්තිප්‍රණාම, යුක්තිධර්මය
(4) දිවිමඟ, පාපියුම්, හදවිල, මනකුමුදු
(5) සෙත්කවි, සුරඟන, හෙළබොජුන්, සඳහිරු (................)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) නිරිඳු, මුනිඳු, මිගිඳු, ගුරුළිඳු
(2) ගොක්කොළ, ළිග්ගල, ගෙත්තම්, අල්ලස්
(3) වියවුල්, පන්සිල්, සිවුරඟ, කටුවල
(4) කුසලාකුසල, කෝපාග්නිය, ජාතිකානුරාගය, වාචිකාභිනය
(5) පෙරපර, දිවග, දෙවඟන, තොලග (................)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) වෛශාරද්‍ය, වෛකල්පික, වෛශ්‍ය, වෛශේෂික
(2) සද්ගුණ, තද්භව, තත්කාලීන, වාක්කෝෂය
(3) වයත, කියත, ගයත, වියත
(4) ශෝභාවත්, ප්‍රභාවත්, අලෝකවත්, ගුණවත්
(5) කළුදොදොල්, මුංකැවුම්, පැණිවළලු, පුහුල්දෝසි (................)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) ඩී. එස්. සේනානායක මහතා දක්ෂ ජන නායකයකු විය.
(2) උගතුන් රට හැර ගොස් ඇත.
(3) අයෙක් නොකල්හි වීථි සඤ්චාරය කරයි.
(4) නුඹ ද මැණියෝ ද දරුවෝ ද ගමට යති.
(5) රජකු මෙන් ජීවත් වූ ජිනදාස සිඟන්නෙක් මෙන් මිය ගියේ ය. (................)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) කොහොම ද ඔය පැත්තෙ තොරතුරු?
(2) මොකක් ද ළමයෝ ළිඳ ගාවට වෙලා කරන්නේ?
(3) මම පොත් ටිකත් අරන් පාසල් යමි.
(4) කම්කරුවෝ වහ වහා තම වැඩ නිම කරති.
(5) එහෙනං හවස් ජාමෙ මේ පැත්තෙ එන්නකෝ. (................)

(ලකුණු 20 යි.)

## II කොටස

මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලු හා අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ දිගු කාලයක් මුළුල්ලේ හඳුනා ගෙන පුළුල් සාකච්ඡාවට භාජනය කොට ඇත. එහෙත්, ඒවා පිළිගැනීම හා ක්‍රියාත්මක කිරීම කෙටිකාලීන දේශපාලනික අවශ්‍යතා හේතු කොට ගෙන පමා වෙමින් පවතී. මෙම තත්ත්වය, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි දක්වන අවධානය සහ කැපවීම පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් ඉස්මතු කර ඇත. ඒ අනුව, ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට, අවබෝධාත්මක ජාතික එකඟතාවක් සහ දැඩි කැපවීමක් අතිශයින් අවශ්‍ය වේ. මෙම ප්‍රබල උත්සාහයේ දී විවෘත හා අවංක සාකච්ඡා සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වල අගය අවතක්සේරු කළ නොහැකි ය. අවශ්‍ය ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ විස්තීර්ණ හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතින ඒවා ය. එම නිසා මේවායේ ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා ප්‍රතිපත්ති නිසි පරිදි පෙළ ගැස්වීම, පරස්පර විරෝධී නොවන බව සහ අඛණ්ඩ ව ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම අවශ්‍ය වේ. මේ අතර රාජ්‍ය ප්‍රතිපත්තිවල විනිවිද භාවය සහ වගකීම් වැඩිදියුණු කිරීම මගින් ප්‍රතිපත්තිවල විශ්වාස කටයුතු භාවය සහ මහජන අනුග්‍රහය ශක්තිමත් විය හැකි අතර, දූෂණ අවම කර ගැනීමට ද හැකි වනු ඇත. එමෙන් ම, වෙළෙඳපොළ මත පදනම් වූ ආර්ථික ක්‍රමයක සුමට ක්‍රියාකාරිත්වය සඳහා රටෙහි නීතිය හා සාමය ශක්තිමත් කිරීම ද ඉතා ප්‍රබල අවශ්‍යතාවකි. නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දී වසර 25කට පසු ව වුව ද, ආර්ථිකයේ සමහර අංශවල රාජ්‍ය අංශය තවමත් ප්‍රබල ව පවතින බැවින් රජයේ කාර්යභාරය පැහැදිලි ව නිර්වචනය කිරීම වැදගත් වේ. කුඩා එහෙත් කාර්යක්ෂම හා ගතික රාජ්‍ය අංශයක අවශ්‍යතාව පවත්නා අතර එහි කාර්යභාරය විය යුත්තේ ආර්ථික කටයුතුවලට මැදිහත් වනවාට වඩා පහසුකම් සලසන්නකු ලෙස ක්‍රියා කිරීම ය.

(i) කෙටිකාලීන දේශපාලනික අවශ්‍යතා හේතු කොට ගෙන පමා වෙමින් පවතින්නේ කුමක් ද?
(ii) ආර්ථික ප්‍රතිසංස්කරණ සම්බන්ධ ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද?
(iii) ආර්ථික ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද?
(iv) වෙළෙඳපොළ මත පදනම් වූ ආර්ථික ක්‍රමයක සුමට ක්‍රියාකාරිත්වය සඳහා බලපාන ප්‍රබල අවශ්‍යතාව කුමක් ද?
(v) රාජ්‍ය ප්‍රතිපත්තිවල විනිවිදභාවය හා වගකීම් වැඩි දියුණු කිරීම මගින් සැලසෙන වාසි කවරේ ද?
(vi) නිදහස් ආර්ථික ප්‍රතිපත්තිවලින් නිසි ප්‍රයෝජන ලැබීම උදෙසා රජයේ කාර්යභාරය විය යුත්තේ කුමක් ද?

(ලකුණු 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග **වචන සංඛ්‍යාව** ද සඳහන් කරන්න.

අධ්‍යාපනයේ එක් අංශයක් පමණක් - එනම් විද්‍යාව - හැදෑරීමේ සීමාන්තික උද්‍යෝගයෙන් වැඩුණු අද සමාජය පුළුල් ශාස්ත්‍රීය අධ්‍යාපනය පිළිබඳ පරමාර්ථ අමතක කළා සේ පෙනේ. විශේෂඥතාවේ ග්‍රහණයෙන් ඇතැමුන්ගේ මනස නිදහස් කිරීමට නම් මානව ශාස්ත්‍ර හැදෑරීමත් විද්‍යාව හැදෑරීමත් අතර මනා තුලනයක් ඇති කළ යුතු ය. හුදෙක් දැනුම දීමට වඩා විශාල සේවාවක් පාසලින් ඉටු විය යුතු ය. විවිධ ජාතිකයන් අතර සංස්කෘතික සම්බන්ධතාවට අනුබල දී වැඩි දියුණු කළ යුතු ය. ශිෂ්‍යයාත් ලෝකයත් අතර සම්බන්ධය ඇති කොට ඔහුගෙන් සිය පරිසරයටත් මහඟු මෙහෙයක් ඉටු වීමට අවකාශ සැලසිය යුතු ය. එබැවින් මානව ශාස්ත්‍ර, සමාජීය විද්‍යා සහ කාර්මික ශිල්ප ආදි විෂයයන්ට හිමි තැන් දෙන අංග සම්පූර්ණ අධ්‍යාපන ක්‍රමයක් අත්‍යවශ්‍ය බව පුන පුනා කිව යුතු නො වේ.

පෙර මෙන් නොව අද පාසලෙන් හා දැනුම විසුරුවා ලන විවිධ මාධ්‍යයන් මගින් ශිෂ්‍යයන්ට දැනුම ලබා ගැනීමේ බොහෝ අවස්ථා හා පහසුකම් සැලසී ඇත. පුළුල් වන දැනුම් ක්ෂේත්‍රය දෙස ඔවුන් බලන්නේ උද්‍යෝගයෙන් සහ අපේක්ෂණයෙනි. එබැවින් ඔවුහු පෙරට වඩා ඉක්මනින් මුහුකුරා ගිය නුවණින් නොයෙක් කරුණු ගැන කල්පනා කරන්නට ළැදි වෙති. රටෙහි දැන් පවත්නා තත්ත්වය සමාජ අංශයෙන් වේවා, ආර්ථික අංශයෙන් වේවා, අපට කල්පනා කළ හැකි අන් කවර අංශයකින් වේවා වැඩි දියුණු කරවන ව්‍යාපාරයන්ට ඔවුහු මහත් උද්‍යෝගයකින් අනුබල දෙති.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) නව තාක්ෂණික උපාංග භාවිතය ප්‍රචලිත කිරීමෙන් අධ්‍යාපනය කෙරෙහි ඇති කෙරෙන බලපෑම

(ii) බෝ නොවන රෝග ව්‍යාප්තිය සඳහා හේතු වන වර්තමාන ජීවන රටාව

(iii) ජාතික අනන්‍යතාව ගොඩ නැංවීමෙහි ලා භාෂාවේ පවත්නා වැදගත්කම

(iv) අපරාධ හා අපචාර මර්දනයේ දී ජනමාධ්‍යයෙන් ඉටු විය යුතු කාර්යභාරය

(v) රටක් සංවර්ධනයේ දී විදේශ ණය මත පමණක් යැපීමේ යෝග්‍යතාව

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස්** තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) දරුවෝ නොමග යත් නම් දෙමවුපියෝ ඒ ගැන විමසිලිමත් විය යුතු ය.

(ii) මේ නිවසේ සිටින්නන් කවුරු ද?

(iii) අපි හෝ මිතුරෝ හෝ දේශනයට සහභාගි වෙති.

(iv) ගායිකාවක් වූ ඈ දයාබර මාතාවක් ද වූවා ය.

(v) සේවකයෝ සියලු දෙනා අද දින සේවාවට වාර්තා කොට ඇත.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ගුරුතුමිය මා ද නංගී ද අනතුරින් බේරා ගත්තා ය.

(ii) අලගියවන්න මුකවෙටි සුභාෂිතය රචනා කළේ ය.

(iii) ආණ්ඩුකාරවරයා විදේශ අමුත්තන් සාදරයෙන් පිළිගනියි.

(iv) නවකතා රචකයෝ නව භාෂා රීතීන් නිපදවති.

(v) මාර්ටින් වික්‍රමසිංහයෝ මධ්‍යම පාන්තික සමාජය විවරණය කරමින් යුගාන්තය රචනා කළහ.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ඇතැම් (ගුරුවරු/ගුරුවරුන්) නූතන සාහිත්‍ය කෘති කියවීමට රුචියක් (දක්වති/දක්වයි.)

(ii) (නිවේදකයකු/නිවේදකයෙක්) ලෙස සේවාව කරන එතුමා දක්ෂ නාට්‍ය (ශිල්පියකු/ශිල්පියෙක්) ද වෙයි.

(iii) (කවියෝ/කවියන්) වනාහි රස ඇති ලොවක් (මවන්නෝ/මවන්නන්) යැයි පිළිගැනීමක් පවතී.

(iv) විදුහල්පතිතුමා (ශිෂ්‍ය නායිකාවෝ/ශිෂ්‍ය නායිකාවන්) කාර්යාලයට (කැඳෙව්වේ ය/කැඳෙව්වෝ ය.)

(v) සීගිරි (කාශ්‍යපයෝ/කාශ්‍යපයන්) අසිරිමත් සීගිරිය නිර්මාණය (කළාහු ය/කළේ ය.)

(ලකුණු 05 x 3 = 15 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

(i) **සුධීමතා ගුරූපදේශ** රහිත ව **ම** ශාස්ත්‍ර ඥානය ලබයි.

(සුධීමතා - තද්ධිත, ගුරූපදේශ - සන්ධි, ම - නිපාත)

(ii) සසර **සරන** තුරු **සුදන** ඇසුර ම **ලබම්වා!**

(සරන - කෘදන්ත, සුදන - උපසර්ග, ලබම්වා - ක්‍රියා)

(iii) ලලනාවෝ **ස්වර්ණාභරණයෙන්** ගත **ද** නේත්‍රාඤ්ජනයෙන් **දෙනුවන්** ද සරසති.

(ස්වර්ණාභරණයෙන් - සන්ධි, ද - නිපාත, දෙනුවන් - සමාස)

(iv) **පලුපලමල්** සසිරි තුරු වදුලට වදින **සිදඟනන් බලව.**

(පලුපලමල් - සමාස, සිදඟනන් - සන්ධි, බලව - ක්‍රියා)

(v) **සිමෙන්ති ගඩොලින් බැඳි** තට්ටු නිවාසය **භූමිකම්පාවෙන්** කඩා වැටුණේ ය.

(සිමෙන්ති ගඩොලින් - සමාස, බැඳි - කෘදන්ත, භූමිකම්පාවෙන් - විභක්ති)

(ලකුණු 05 x 3 = 15 යි.)

**6.** පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(නිවැරදි, හෙළ, සුරැකීම, දේශීය, සංරක්ෂණය, නිරවද්‍ය)

(අ) (i) ................................ වෙදකම වනාහි පුරාතනයේ පටන් පැවත එන්නකි.

(ii) රටක අනාගත සංවර්ධනය උදෙසා නායකයන් සතු ...................... දැක්ම ඉවහල් වෙයි.

(iii) ........................... තාක්ෂණය ප්‍රබල ව ඉස්මතු වූ අංශයක් වනුයේ වාරි කර්මාන්තය යි.

(iv) පුරාවස්තු ....................... සංචාරක ආකර්ෂණයට හේතුවකි.

(v) භාෂාවක් භාවිතයේ දී .......................... ව්‍යවහාරය අතිශයින් වැදගත් ය.

(vi) දරුවන් ........................ සමාජ සේවා නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණයට ලක් විය යුතු ය.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අධ්‍යයන + අංශය (ii) ක්‍රිස්තු + උත්පත්තිය

(iii) එකින් + එක (iv) ජන්ම + උත්සවය

(v) බුද්ධි + ඉන්ද්‍රිය (vi) පුර + අඟන

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **දරුවනි,** මා එන තුරු නිහඬ ව සිටින්නැයි **ගුරුතුමා** කීවේ ය.

(ii) "එන්න **දියේ** බැස මා හා - දෙන්න **ඔබේ** අත මාලා"

(iii) පරිසරය අලංකාර කරන **සතුන්** පිළිබඳ ව අපි **දරුවන්ට** කියා දුන්නෙමු.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) විදේශ සංචාරකයා ලංකාවට පැමිණියේ ය සීගිරියට ගියේ ය. එය ක්‍රි ව පස් වන සියවසේ දී නිර්මාණය කළ බව අසා ඔහු පුදුම විය.

(ii) දරුවා අඬමින් ඉකි ගසමින් මවගේ උකුළෙහි දිගා වූයේ ය. ඇ දොයි දොයි දොයි යනුවෙන් ඔහු නැළවූවා ය.

(iii) ශිෂ්‍යයා ශිෂ්‍යාව 'මඟුල් කෑම' ග්‍රන්ථයේ 24 26 පිටුවලින් ඡේද උපුටා දක්වයි.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මං අද විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් පත්‍රය යවනවා"යි නාලිකා පැවසුවා ය.

(ii) "ඩෙංගු රෝගය පැතිරීම වළක්වා ගැනීමට ඔබගේ නිවස සහ අවට පරිසරය පිරිසිදු ව තබා ගන්නැ"යි මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුම් දුන්නේ ය.

(iii) "අපි අපේ දරුවන්ට උගන්නන්නේ හරියට දුක් මහන්සි වෙලා"යි දෙමවුපියෝ ගුරුවරුන්ට පැවසූහ.

(ලකුණු 01 x 3 = 03 යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පැරණි සමාජවල ජීවන ක්‍රම සහ කුසලතා විමසා බැලීමට කැප වූ පුරාවිද්‍යාව පැරණි යුගවලට අයිති භෞතික නෂ්ටාවශිෂ්ට සොයා ගැනීමේත් අධ්‍යයනය කිරීමේත් ශික්ෂණ මාර්ගයකි. අභාවයට ගිය ශිෂ්ටාචාරවලින් ශේෂ වූ නටබුන්, විශේෂයෙන් ම **සර්මකලාපීය** රටවල හමු වන නටබුන්, විෂම වූ තෙත් සහ උෂ්ණ දේශගුණයට හසුවෙමින් පවතින හෙයින් දැන් **සාමාන්‍යයෙන්** සම්මත ශිල්පක්‍රම අනුව පරීක්ෂණයට භාජන කෙරෙයි. එබඳු ක්‍රමික අධ්‍යයනයක පළමු පියවර වනුයේ පුරාවස්තු පිළිබඳ අනාවරණය, **ගවේෂණය** සහ තොරතුරු සටහන් කර ගැනීමයි. ඉක්බිති ව පුරාවස්තු කැණීම, පැරණි ගොඩනැගිලි සහ **කලාත්මක** කෞතුක භාණ්ඩ ආරක්ෂා කිරීම, **ශිලාලේඛන** සහ **පුරාවස්තු** පිළිබඳ **පර්යේෂණ** පැවැත්වීම සිදු කළ යුතු වේ.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) භෞතික, තොරතුරු, ගොඩනැගිලි යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. මහාප්‍රාණ අක්ෂරයක් සහ අන්තඃස්ථ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයක්
2. තාලුජ අක්ෂරයක් සහ මූර්ධජ අක්ෂර දෙකක් යෙදුණු වචනයක්
3. තාලුජ අක්ෂරයක් සහ මහාප්‍රාණ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනයක්

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
නෂ්ටාවශිෂ්ට, අනාවරණ, පරීක්ෂණ

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.
පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

(ලකුණු 03 x 5 = 15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) විධි ක්‍රියා

(ii) ස්වරාදේශ සන්ධිය

(iii) විභක්ති සමාසය

(iv) තුල්‍යාර්ථයේ නිපාත

(v) ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය

(ලකුණු 05 x 3 = 15 යි.)

* * *